# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 73 දරන ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 දෙසැම්බර් මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 දෙසැම්බර් මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 6.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2009 අංක 73 දරන ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 දෙසැම්බර් මස 23 වන දින]

එල්. ඩී.— ඕ. (අයි.එන්.සී.) 1/2007.

### ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ ආයතනය හා සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් කොළඹ, පිහිටුවා තිබූ හෙයින් ද :

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් සහ එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලීමක් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2009 අංක 73 දරන ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනයේ දැනට සංස්ථාපිත හා සංස්ථාපිත නොවූ සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක්

ඇති සංස්ථාවක් විය යුතු ය. තවද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති කළමනාකරණ විද්‍යාව සහ පරිචය ප්‍රවර්ධනය කිරීම සහ නංවාලීම ;

(ආ) ව්‍යාපෘති කළමනාකරණයෙහි වෘත්තීයතාව පෝෂණය කිරීම ;

(ඇ) තාක්ෂණික හා කළමනාකරණ පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාමෙන්, කඩිනම් සන්නිවේදන ක්‍රම හා සාකච්ඡා හඳුන්වා දීමෙන්, වෘත්තීයමය වශයෙන් වැදගත්වන කාරණා පිළිබඳව ප්‍රකාශන පළ කිරීම සහ වෙනත් එවැනි මාර්ගවලින් ව්‍යාපෘති කළමනාකරණ ක්ෂේත්‍රයේ ශාස්ත්‍රීය හා කාර්මික පර්යේෂණ හා තාක්ෂණික දැනුම අත්කර ගැනීමට හා හුවමාරු කරගැනීමට සහාය වීම ;

(ඈ) ව්‍යාපෘති කළමනාකරණ අධ්‍යයන ප්‍රවර්ධනය කිරීම, ස්වතන්ත්‍ර පර්යේෂණ දිරිගැන්වීම හා ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක හා ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් ඇති කිරීම අරභයා නිදහසේ අදහස් හුවමාරු කර ගැනීම, යොදා අදාල කර ගැනීම හා විසඳුම් ලබා දීම සඳහා පිළිගැනීමක් ඇති උපචාරාලයක් ඇතිකර ගැනීම ;

(ඉ) සංස්ථාවේ සාමාජිකත්වය ලබාදීම සඳහා ද ව්‍යාපෘති කළමනාකරණ ක්ෂේත්‍රයේ නියුක්ත තැනැත්තන්ගේ යෝග්‍යතාව පරීක්ෂා කර යෝග්‍යතා සහතික නිකුත් කිරීම පිණිස ද විභාග පැවැත්වීම ;

(ඊ) සාමාජිකත්වයේ විවිධ ශ්‍රේණිවලට ඇතුළත් කර ගැනීම සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් නිශ්චය කිරීම ;

(ඌ) ව්‍යාපෘති කළමනාකරණ ක්ෂේත්‍රයේ ආචාර ධර්ම ප්‍රමිති සහ ප්‍රතීතනය පවත්වා ගැනීම ;

(ඍ) වෘත්තීය කටයුතු විධිමත් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණයෙහි උසස් තත්ත්වයක් පවත්වාගෙන යාමෙහි ලා සහාය වීම ;

(එ) ව්‍යාපෘති කළමනාකරණයේ සියලුම මට්ටම්වලට අදාළ ක්ෂේත්‍රයන්හි අධ්‍යාපන හා රැකියා සංවර්ධනය සහ ශාස්ත්‍රීය හා කාර්මික පර්යේෂණ දිරිගැන්වීම සඳහා විශ්ව විද්‍යාල සහ වෙනත් අධ්‍යාපන ආයතන සමග සම්බන්ධීකරණයෙන් ක්‍රියා කිරීම ;

(ඒ) ආයතනයේ සාමාජිකයන්ගේ සහ පොදු මහජනයාගේ යහපත පිණිස අවශ්‍ය ගොඩනැගිලි සහ ද්‍රව්‍ය සපයා පවත්වාගෙන යාම;

(ඔ) විනිශ්චයකරුවන් සහ බේරුම්කරුවන් මගින් ආරවුල් නිරවුල් කිරීමට, දිරිගැන්වීම හා ඒ සඳහා සහාය වීම සහ විනිශ්චයකරුවන්ගේ හා බේරුම්කරුවන්ගේ මණ්ඩලයක් පවත්වාගෙන යාම ;

(ඕ) ව්‍යාපෘති කළමනාකරණය හා සම්බන්ධ වෙනත් රාජ්‍ය හා පෞද්ගලික සංවිධාන සමග ජාත්‍යන්තර වශයෙන් සම්බන්ධතා ඇති කර ගැනීම සහ පොදු වැදගත්කමක් ඇති කාරණාවල දී සහයෝගය දීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් විවෘත කිරීමේ පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ සියල්ල ම හෝ ඉන් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන කවර වුවද ආකාරයක සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන, සංස්ථාවේ රීතිවලට යටත් ව, ඒ රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි හා ඒ අනුව තෝරා පත් කර ගනු ලබන සභාපතිවරයාගෙන්, ආසන්නතම පූර්ව සභාපතිවරයාගෙන්, උප සභාපතිවරයාගෙන්, ලේකම්වරයාගෙන්, භාණ්ඩාගාරිකවරයාගෙන් උප ලේකම්වරයාගෙන්. සංස්කාරකවරයාගෙන්, උප භාණ්ඩාගාරිකවරයාගෙන් සහ අනෙකුත් නිලධරයන්ගෙන් සමන්විත සභාවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ කමිටුවේ ධුර දැරූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් මෙහි පහත දැක්වෙන කාරණා එකක් හෝ වැඩි ගණනක් සඳහා කලින් කල යම් මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ ඔවුන් සාමාජිකත්වයෙන් පහ කිරීම සහ සාමාජික නාමලේඛනයේ ඇතුළත් කළ යුතු කරුණු ;

(ආ) සභාවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ සභාවේ සමාජිකයන්ගේ ධුර කාලය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සභාවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, ඒ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒ රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන සහ ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් , න්‍යාය පත්‍ර සහ රැස්වීම් සඳහා ගණපූරණය සහ රැස්වීම්වල දී කළ යුතු කටයුතු ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය කිරීම ;

(ඊ) පොදුවේ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) එම රීති, එවැනි ම රැස්වීමක දී හා එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සාමාජික නාමලේඛනය.

**7.** සංස්ථාවේ සභාව විසින්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයේ දී සංස්ථාවේ සාමාජිකයකුව සිටින සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු ලෙස යථා පරිදි ඇතුළත් කරගන්නා සෑම තැනැත්තකුගේ ම නම, ලිපිනය සහ සංස්ථාවේ රීති යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් තොරතුරු ද සටහන් කර තැබිය යුතු ලේඛනයක් පවත්වා ගැනීමට සැලැස්විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල් ගාස්තු හෝ ප්‍රදාන, වශයෙන් මේ දක්වා හෝ මින් මතු සංස්ථාවට ලැබෙන සියලු මුදල්, සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි, සංස්ථාවේ බැරට බැංකු එකක හෝ වැඩි ගණනක තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**9.** (1) සංස්ථාවේ සභාව විසින් සංස්ථාවේ ආදායම සහ වියදම පිළිබඳ නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් යටත් පිරිසෙයින් වසරකට එක් වරක්වත් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කළ යුතු ය.

(3) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

ආයතනය විසින් සහ ආයතනයට ගෙවිය යුතු ණය.

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ පැවති සියලු ණය හා බැරකම්, සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, ඒ දිනය වන විට ආයතනයට අයවිය යුතු සියලු ණය සහ ආයතනයට ගෙවනු ලැබිය යුතු සියලු සාමාජික මුදල් හා දායක මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ ආදායම හා දේපළ යෙදවීම.

**11.** කවර වූ හෝ ආකාරයකින් ලැබුණා වූ සංස්ථාවේ මුදල් සහ දේපළ මෙහි දක්වා ඇති පරිදි හුදෙක් ම සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා යොදවනු ලැබිය යුතු අතර, ඉන් කිසිම කොටසක් ලාභාංශ, ප්‍රසාද දීමනා, ලාභ හෝ අන් කවර වූ හෝ ආකාරයකින් සංස්ථාවේ සාමාජිකයන්ට ඍජුව හෝ වක්‍රව ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

ගාස්තු හා දායක මුදල් අයකිරීමට බලය ඇති බව.

**12.** පහත සඳහන් ගාස්තු හා දායක මුදල් අයකිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) සංස්ථාව විසින් පවත්වනු ලබන යම් පාඨමාලාවකට හෝ විභාගයකට ඇතුළත් කර ගැනීම සඳහා සාධාරණ යයි සංස්ථාව සලකන යම් ගාස්තු ;

(ආ) සංස්ථාවේ කවර හෝ වර්ගයක සාමාජිකත්වය සඳහා තැනැත්තන් බඳවා ගැනීම සඳහා ගාස්තු ; සහ

(ඇ) සංස්ථාවේ සාමාජිකයන්ගෙන් අයකර ගැනීම උචිත යයි සංස්ථාව විසින් සලකනු ලැබිය හැකි දායක මුදල් හා ගාස්තු.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දරනු ලැබිය හැකි බව.

**13.** මේ පනතේ විධිවිධානවලට යටත්ව මිල දී ගැනීමෙන්, ප්‍රදානයකින්, ත්‍යාගයක් වශයෙන්, තෙස්තමේන්තු නීයාදනයකින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට හැකියාව හා බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාව විසින් මේ පනතේ කාර්යය සඳහා, 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත් ව, ඒ දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**14.** සංස්ථාවේ මුද්‍රාව, එක් සාමාජිකයකු සභාපතිවරයා විය යුතු සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයට ඔවුන්ගේ නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

විනය කමිටු.

**15.** වෘත්තීය ප්‍රමිති පාලනය කිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ ව්‍යපෘති කළමනාකරුවන් වශයෙන් වෘත්තියේ යෙදෙන හෝ ක්‍රියා කරන තැනැත්තන් අතර විනය පාලනයක් පවත්වා ගැනීම පිණිස උචිත යයි කලින් කළට සළකනු ලබන විනය කමිටු පත් කිරීමට හා වෙනත් යම් පියවර ගැනීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

විසුරුවා හැරීම.

**16.** සංස්ථාව විසුරුවා හැරීමක දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසුව යම් දේපළක් ඉතිරිව ඇත්නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා හරිනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් සිය සාමාජිකයන් අතර බෙදා හැරීම තහනම් කර ඇත්තා වූ ද යම් ආයතනයකට හෝ ආතනනවලට, දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරින අවස්ථාවේ දී හෝ විසුරුවා හැරීමට පෙර, ඒ ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාවේ සාමාජිකයන් විසින් නිශ්චය කළ යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

17. ජනරජයේ හෝ යම් රාජ්‍ය සංස්ථාවක හෝ මණ්ඩලයක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් ඇති නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

18. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.